## 2023-11-06 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. විසල් හම්බන්තොට සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉඩම් අත්කර ගැනීම හා පවරා ගැනීම හේතුවෙන් නිවාස අහිමි වූ පවුල් සඳහා විකල්ප ඉඩම් ලබා දීම

විසල් හම්බන්තොට සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් පවුල් 97ක ගේ නිවාස අහිමි වී ඇති බැවින් ඔවුන් වෙත විකල්ප ඉඩම් ලබා දිය යුතුව ඇත. ඒ සඳහා හම්බන්තොට සිරිබෝපුර ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර 10.11ක් පමණ වූ රජයේ ඉඩමක් හඳුනාගෙන තිබේ. එම ඉඩමේ නේවාසික භාවිතය සඳහා බිම් කොටස් 126ක් හඳුනාගෙන ඇති අතර, මේ වන විට නිවාස අහිමි වූ පවුල් 97න් පවුල් 84ක් සඳහා බිම් කොටස් වෙන් කර දී ඇත. මේ සම්බන්ධයෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සැලකිල්ලට ගනිමින්, විසල් හම්බන්තොට සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් නිවාස අහිමි වූ පවුල් සඳහා හම්බන්තොට සිරිබෝපුර පිහිටි හෙක්ටයාර 10.11ක් පමණ වූ රජයේ ඉඩමෙන් ඉඩම් කොටස් වෙන් කර දීමටත්, එකී ඉඩම් කොටස් සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ මග පෙන්වීම යටතේ නීත්‍යානුකූල දීමනා පත්‍ර නිකුත් කිරීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

### 02. බම්බලපිටිය සහ වැල්ලවත්ත දුම්රිය ස්ථාන අසලින් මැරීන් ඩ්‍රයිව් මාර්ගය හරහා ඉදි කර ඇති පදික පාලම් ප්‍රතිනිර්මාණය කිරීම

බම්බලපිටිය සහ වැල්ලවත්ත දුම්රිය ස්ථාන වෙත ප්‍රවේශ වීම සඳහා මැරීන් ඩ්‍රයිව් මාර්ගය හරහා ඉදි කර ඇති පදික පාලම්වල අවදානම් තත්ත්වය සලකා තාවකාලික පියගැටපෙළවල් ඉදිකිරීමේ සහ කඩිනමින් පදික පාලම් ප්‍රතිනිර්මාණය කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, හදිසි මෙන්ම අත්‍යවශ්‍ය ඉදිකිරීමක් වන එකී පාලම් ප්‍රතිනිර්මාණය කිරීමේ කොන්ත්‍රාත්තුව මාස හයක (06) කාලසීමාවක් තුළ නිම කිරීමේ කොන්දේසියට යටත්ව, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව වෙත පැවරීම පිණිස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**03. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ කිරි මණ්ඩල මාවතේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා යෝජනා සඳහා ඉල්ලීම් කැඳවීම**

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් සංවර්ධනය කරන ලද අක්කර 05ක පමණ විශාලත්වයෙන් යුත් ඉඩමක් නාවල කිරි මණ්ඩල මාවතේ පවතින අතර, එය මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය බවට හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, පළමු අදියරේදී එකී ඉඩමෙන් අක්කර 2.67ක භූමි ප්‍රමාණයක සහ දෙවන අදියරේදී ඉතිරි අක්කර 2.33ක භූමි ප්‍රමාණයේ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස උනන්දුවක් දක්වන ආයෝජකයින්ගෙන් යෝජනා සඳහා ඉල්ලීම් කැඳවීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**04. (235 වන අධිකාරය වන) රේගු ආඥාපනත සඳහා යෝජිත සංශෝධන**

ආදායම් රැස් කිරීම, විනිවිදභාවය, වෙළෙඳාම් සඳහා පහසුකම් සැලසීම සහ අනුකූලතා අවශ්‍යතා වැනි කරුණු සම්බන්ධයෙන් (235 වන අධිකාරය වන) රේගු ආඥාපනතේ 47, 57 සහ 153 වගන්තීන් සංශෝධනය කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහා 2022-10-03 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. එසේම, ශ්‍රී ලංකාව රේගුව විසින් රඳවා ගනු ලැබ ඇති භාණ්ඩ නිදහස් කිරීමට අදාළව පවතින ගැටලු අධ්‍යයනය කර වාර්තා කිරීම සඳහා ගරු වරාය, නාවික හා ගුවන් සේවා ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද අමාත්‍ය කමිටුව විසින් ඉදිරිපත් කර තිබූ නිර්දේශ සැලකිල්ලට ගනිමින් රේගු ආඥාපනතේ අදාළ විධිවිධාන සංශෝධනය කිරීම පිණිස 2023-09-04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, යෝජිත සංශෝධනයන්ට අදාළව රේගු ආඥාපනත සංශෝධනය කිරීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **නොතාරිස් ආඥා පනත සඳහා සංශෝධන**

2022 අංක 31 දරන නොතාරිස් (සංශෝධන) පනතේ පවතින අවිනිශ්චිත අර්ථ ව්‍යාකූලතා/සංකූලතාවලට පිළියමක් ලෙස එම පනත සංශෝධනය කිරීම පිණිස 2023-05-08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. අදාළ සංශෝධන ඇතුළත් කරමින්, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පතට නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. ඒ අනුව, එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **වංචා වැළැක්වීමේ ආඥා පනත සඳහා සංශෝධන**

2022 අංක 29 දරන අන්තිම කැමති පත්‍ර (සංශෝධන) පනතට සහ 2022 අංක 31 දරන නොතාරිස් (සංශෝධන) පනතට හඳුන්වා දෙන ලද සංශෝධනවලට අනුකූලව 2022 අංක 30 දරන පනත මඟින් වංචා වැළැක්වීමේ ආඥාපනත සංශෝධනය කරනු ලැබ ඇත. 2022 අංක 31 දරන නොතාරිස් (සංශෝධන) පනතේ පැන නැගී ඇති අවිනිශ්චිත අර්ථ ව්‍යාකූලතා/සංකූලතා මග හරවා ගැනීම පිණිස එම සංශෝධන පනත තවදුරටත් සංශෝධනය කිරීමටත්, ඊට සමගාමීව වංචා වැළැක්වීමේ ආඥාපනතේ අදාළ විධිවිධාන සංශෝධනය කිරීමටත් 2023-05-08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, වංචා වැළැක්වීමේ ආඥාපනත සංශෝධනය කිරීම පිණිස නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පතට නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **ශ්‍රී ලංකා ආර්ථික කොමිෂන් සභාව පිහිටුවීම සහ ශ්‍රී ලංකාවේ නව ආයෝජන පනත් කෙටුම්පත සකස් කිරීම**

ආයෝජන සහ අපනයන ප්‍රවර්ධනය සඳහා වඩාත් හිතකර පරිසරයක් නිර්මාණය කිරීම පිණිස සවිමත් යාන්ත්‍රණයක් පැවතීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන, ආයෝජන මණ්ඩලය සහ අපනයන සංවර්ධන

මණ්ඩලය ඒකාබද්ධ කරමින් නව ආයතනයක් ස්ථාපිත කිරීම පිණිස 2023-01-16 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, එම කාර්යය සඳහා අවශ්‍ය පියවර ගැනීම පිණිස අදාළ ක්ෂේත්‍රවල විශේෂඥතාව සහිත පුද්ගලයින්ගෙන් සමන්විතව අපනයන හා ආයෝජන පිළිබඳ අධීක්ෂණ කමිටුවක් ජනාධිපති කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇත. එකී කමිටුව විසින් අදාළ සියලු කරුණු අධ්‍යයනය කර නව ආයතනික ව්‍යුහයක් පිහිටුවීම සඳහා වන යෝජනා ඉදිරිපත් කර ඇති අතර එකී යෝජනා මත පදනම්ව නව ආයෝජන සහ අපනයන ප්‍රවර්ධන ආයතනික සැලැස්මක් හඳුන්වා දීමටත්, ඒ යටතේ ශ්‍රී ලංකා ආර්ථික කොමිෂන් සභාව සහ ඒ ආශ්‍රිත ඒකක ආයතනිකව පිහිටුවීම ආරම්භ කිරීමටත් අදාළ පියවර ගැනීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 08. ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයන් පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබා ගැනීම

පහත සඳහන් ආඥාව සහ නියමයන් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

(i) 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ විධිවිධාන පරිදි අංක 2347/06 දරන 2023-08-29 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති ආදායම් සංරක්ෂණ ආඥාව.

(ii) 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ වන විධිවිධාන පරිදි ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති පහත සඳහන් ගැසට් නිවේදනයන් මඟින් ප්‍රකාශයට පත් කර තිබෙන නියමයන්:

* අංක 2343/11 දරන 2023-08-01 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති නියමය.
* අංක 2345/64 දරන 2023-08-17 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති නියමය.

* අංක 2346/16 දරන 2023-08-21 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති නියමය.

* අංක 2348/44 දරන 2023-09-08 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති නියමය.

* අංක 2353/77 දරන 2023-10-14 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති නියමය.

************